# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,931/5 — 1970 නොවැම්බර් 8 වැනි ඉරිද — 1970.11.8

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සැම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)

## පළාත් පාලන නිවේදන

එල්.ඩී.—බී. 24/70.

### සුළු නගර සභා ආඥපනත

**2, 5, 6 සහ 9 වැනි වගන්තිය යටතේවූ ආඥව**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 2, 5, 6 සහ 9 වැනි වගන්තිවලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද ආඥවයි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති,

1970 නොවැම්බර් මස 8 වැනි දින,
කොළඹ දී ය.

### ආඥව

අලව්ව සුළු නගර සභාව සංස්ථාපනයට අදළව 1970 ජූලි 2 වැනි දින අංක 14,912/8 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥව පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි වූ පළමුවන උපලේඛනයෙහි නගරයේ උතුරු සීමා විස්තරය වෙනුවට මෙහි වූ උපලේඛනයේ දක්වෙන විස්තරය ආදේශ කිරීමෙන්; සහ

(2) එහි වූ දෙවන උපලේඛනයෙහි අංක 2 දරන ඡන්ද කොට්ඨාශයේ උතුරු සීමා විස්තරයෙහි "2/3" ඉලක්කම වෙනුවට "1/3" ඉලක්කම ආදේශ කිරීමෙන්.

### උපලේඛනය

උතුරට : අලව්ව-ගිරිඋල්ල පාරේ අංක 8/5 දරන බෝක්කුවේ මැද සිට යාර 200 ක් උතුරින් වූ එකී පාරේ මධ්‍ය රේඛාවට යාර 200 ක් දුරින් සමාන්තර වූ ලක්ෂයයක සිට අලව්ව-දම්පැලැස්ස පාරේ මධ්‍ය රේඛාවට යාර 200 ක් බටහිරින් වූ ලක්ෂයය හමුවන තෙක් නැගෙනහිර දෙසට ඇඳි රේඛාවකින් ද; එතැන් සිට අලව්ව-ගම්පැලැස්ස පාරේ මධ්‍ය රේඛාවට යාර 200 ක දුරින් වූ සමාන්තර රේඛාවක් ඔස්සේ අලව්ව-හපුගහගෙදර (අ.ග.සි. 462) අතර වූ පොදු ගම් මායිම හමුවන තෙක් උතුරු දෙසට ද; එතැන් සිට එකී ගම් මායිම ඔස්සේ අලව්ව-දම්පැලැස්ස පාරේ අංක 2/2 දරන බෝක්කුවේ මැදදී එකී පාර හරහා, එකී අලව්ව-දම්පැලැස්ස පාරේ අංක 2/2 දරන බෝක්කුවේ මැදට යාර 200 ක් නැගෙනහිරින් වූ ලක්ෂයය දක්වා නැගෙනහිර දෙසට ද; එතැන් සිට අලව්ව-දම්පැලැස්ස පාරේ මධ්‍ය රේඛාවේ සිට යාර 200 ක් දුරින් වූ සමාන්තර රේඛාවක් ඔස්සේ අලව්ව-ගිරිඋල්ල පාරේ මධ්‍ය රේඛාවේ සිට යාර 200 ක් ඊශාන දිගින් වූ ලක්ෂයයක් දක්වා දකුණු දෙසට ද; එතැන් සිට අලව්ව-ගිරිඋල්ල පාරේ මධ්‍ය රේඛාවේ සිට යාර 200 ක් දුරින් වූ සමාන්තර රේඛාවක් ඔස්සේ කොළඹ මහනුවර ප්‍රධාන දුම්රිය මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට යාර 200 ක් වයඹ දිගින් වූ ලක්ෂයය දක්වා ගිනිකොණ දෙසට ද; එතැන් සිට එකී දුම්රිය මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට යාර 200 ක් දුරින් වූ සමාන්තර රේඛාවක් ඔස්සේ අලව්ව සහ කොහොලාන (අ.ග.සි. 431) පොදු ගම් සීමාව හමුවන තෙක් ඊශාන දෙසට ද; එතැන් සිට එකී ගම් මායිම ඔස්සේ කොළඹ-මහනුවර ප්‍රධාන දුම්රිය මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ගිනිකොණ දෙසට ද; එතැන් සිට කොළඹ-මහනුවර ප්‍රධාන දුම්රිය මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ කොළඹ-කුරුණෑගල පාරේ අංක 44/5 දරන බෝක්කුවේ මැද සිට උතුරින් වූ ලක්ෂයයක් දක්වා ඊශාන දෙසට ඇඳි රේඛාවකින් ද වේ.

11-483/1


806/1——ජේ 18221— 5,675 (70/11)

## ගම්සභා ආඥපනත

1967 අංක 2 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ II වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥව.

fපී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති.

1970 නොවැම්බර් මස 8 වැනි දින,
කොළඹ දී ය.

### ආඥව

පුත්තලම දිස්ත්‍රික්කයේ යටකලන්පත්තු ගම් ප්‍රදේශයේ ගම්සභාවේ දැනට නිල දරන සභිකවරුන්ගේ නිල කාලය අවසන් විය යුතු දිනය වශයෙන් 1970 දෙසැම්බර් මස 31 වැනි දිනය වෙනුවට **1971** ජූනි මස 30 වැනි දිනය මෙයින් නියම කරනු ලැබේ.

11–483/2

---

## ගම්සභා ආඥපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 5 (1) වගන්තිය යටතේ සහ (262 වන අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ 84 වැනි වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥවයි.

fපී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමති.

1970 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

### ආඥව

හලාවත දිස්ත්‍රික්කයේ යටකලන්පත්තු ගම් ප්‍රදේශය, අළුත් ගම් ප්‍රදේශ තුනකට බෙදමින් 5 වෙනි වගන්තිය යටතේ 1970 අප්‍රේල් මස 10 වෙනි දින අංක 14,901 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥවෙන් අවසන් වරට සංශෝධිත 1967 සැප්තැම්බර් මස 22 වන දින අංක 14,767 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥව, එහි වූ 2 (ආ) ඡේදයේ ''1971 ජනවාරි මස පළමුවන දිනය'' යන පාඨය වෙනුවට ''1971 ජූලි මස පළමුවන දිනය'' යන පාඨය ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

11–483/3

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි